# පරිගණක තිරයේ වර්ණ නිවැරදිව මුද්‍රණ යන්ත්‍රයෙන් ලබා ගැනීම

අයෝම ජයසිංහ

**පරිගණක තිරයේ ඇති වර්ණ ඒ සැටියෙන්ම වර්ණ මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය නොවන කාරණය පරිගණක ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැලෙන අය මුහුණ දෙන පොදු ගැටළුවකි. මෙය විසඳීම සඳහා Calibrate කළ මොනිටරයක් අත්‍යවශ්‍ය වන අතර මොනිටරයක් Calibrate කරන අන්දම පසුගිය කලාපයේ සවිස්තරව දක්වා ඇත.**

**මූලික වර්ණ තුන එකකට එකක් විවිධ අනුපාතයන්ගෙන් මිශ්‍රවීමෙන්, අනන්ත අප්‍රමාණ වර්ණ සංඛ්‍යාවක් ජනිත වේ. මෙය ගණනය කළ නොහැකි තරම් වර්ණ සංඛ්‍යාවකි. මෙම මූලධර්මය ප්‍රයෝජනයට ගෙන පරිගණක මොනිටර නිපදවා ඇත. එනම් මොනිටරය ඇතුළත රතු, කොළ, නිල් ආලෝක කදම්බ 3 ක් නිපදවිය හැකි උපකරණ 3 ක් සවිකර ඇති අතර එමගින් නිකුත්වන මූලික වර්ණ 3 විවිධ අනුපාතයන්ගෙන් මිශ්‍රවී පරිගණක තිරයේ පතිත වී මිලියන ගණනක් වර්ණ උත්පාදනය වේ.**







පළමුව පරිගණක තිරයෙන් නිකුත්වන වර්ණවත්, මුද්‍රණ යන්ත්‍රයෙන් ලබා දෙන වර්ණත්, පිළිබඳව සරල දැනුමක් ලබා ගැනීම ඉතා වැදගත් යැයි සිතමි.

අපට ජීවය ලබා දෙන සූර්යයාගෙන් පැමිණෙන ආලෝකය, සුදු ආලෝකයක් වුවත්, එය නිමවී තිබෙන්නේ, රතු, කොළ, නිල් යන මූලික වර්ණ 3 ක් එකට එකතුවීමෙන් බව පෙනේ. (ද්විතීයික වර්ණත් සමග සූර්යාලෝකය වර්ණ 7 කින් සෑදී ඇත.)

මේ අනුව එම මූලික වර්ණ තුන එකකට එකක් විවිධ අනුපාතයන්ගෙන් මිශ්‍රවීමෙන්, අනන්ත අප්‍රමාණ වර්ණ සංඛ්‍යාවක් ජනිත වේ. මෙය ගණනය කළ නොහැකි තරම් වර්ණ සංඛ්‍යාවකි. මෙම මූලධර්මය ප්‍රයෝජනයට ගෙන පරිගණක මොනිටර නිපදවා ඇත. එනම් මොනිටරය ඇතුළත රතු, කොළ, නිල් ආලෝක කදම්බ 3 ක් නිපදවිය හැකි උපකරණ 3 ක් සවිකර ඇති අතර එමගින් නිකුත්වන මූලික වර්ණ 3 විවිධ අනුපාතයන්ගෙන් මිශ්‍රවී පරිගණක තිරයේ පතිත වී මිලියන ගණනක් වර්ණ උත්පාදනය වේ.

රතු, කොළ, නිල් හෙවත් Red, Green, Blue යන පදවල මුලකුරු ගෙන RGB වර්ණ ගෙනදෙන උපකරණයක් ලෙස මොනිටර හැඳින්වේ. එවැනි තවත් RGB වර්ණ ගෙන දෙන උපකරණයකි රූපවාහිනී තිරය. මේ අනුව පරිගණක තිරයෙන් ඔබ දකින ඕනෑම ඡායාරූපයක්, පිංතූරයක් හෝ ග්‍රැෆික් නිර්මාණයක් RGB පිංතූරයකි. මිලියන ගණනක් වර්ණ නිපදවන RGB ක්‍රමය මගින්, නියොන් වර්ණ, ෆ්ලොරසන්ට් වර්ණ හෝ දීප්තිමත් වර්ණ නිදවාගත හැකි නිසාRGB වලට විශාල හෙවත් පළල් වර්ණ පරාසයක් ඇත.

දැන් ඔබ, ඔබගේ පරිගණක මුද්‍රණ යන්ත්‍රය වෙත, අවධානය යොමුකරන්න. එහි ඇත්තේ මූලික වර්ණ 4 ක් සහිත තීන්ත කාට්රිජ් 4 කි. (මුද්‍රණ ක්ෂේත්‍රයේදී මූලික වර්ණ RGB ක්‍රමයට වඩා බොහෝ වෙනස් ය.) එම මූලික වර්ණ නම්, නිල් පැහැය ජනිත කරන සයන්(Cyan) රතු පැහැය ජනිත කරන මැජෙන්ටා(Magenta) කහ පැහැය ජනිත කරන කහ(Yellow) සහ කළු පැහැය ගෙන දෙන කළු(Black) වේ. මේ පදවල මුලකුරු, එනම් CMYK (K යනුBlack වේ) මගින් මෙම මුද්‍රණ ක්‍රමයේ වර්ණ පද්ධතිය හැඳින්වේ.

මෙම මූලික වර්ණ 4 එකකට එකක් විවිධ අනුපාතයන්ගෙන් මිශ්‍රවී, වර්ණ මුද්‍රණ පිටපතක් ඔබට ලබා දේ. මේ අනුව ඔබගේ මුද්‍රණ යන්ත්‍රයCMYK වර්ණ ලබා දෙන උපකරණයකි. පුවත්පත්, සඟරා මුද්‍රණය කරනු ලබන Offset මුද්‍රණ යන්ත්‍රය ද එවැනි ම තවත් CMYK මුද්‍රණ යන්ත්‍රයකි.

CMYK වර්ණ ජනිත කරන, මුද්‍රණ යන්ත්‍රයෙන් වර්ණ මිලියන ගණනක් නොව, එයට වඩා අඩු එනම්, වර්ණ දහස් ගණනක්




පමණක් උත්පාදනය වේ. RGB ක්‍රමයට සාපේක්ෂව CMYKවල වර්ණ පරාසය ඉතා අඩු බව මේ අනුව කිව හැක.

මෙහිදී යම් ගැටළුවක් පැනනගී. අධික වර්ණ පරාසයක් ඇති මොනිටරයේ ඇති පිංතූරයක් අඩු වර්ණ පරාසයක් ඇති මුද්‍රණ යන්ත්‍රයක් තුළින් මුද්‍රණය වන විට, කුමක් සිදුවේද යන්නයි. (1 රූපය)

එවිට අනිවාර්යයෙන්ම RGB මොනිටරයේ ඔබ දුටු පිංතූරයේ වර්ණ දහස් ගණනක් CMYK මුද්‍රණයේදී මුද්‍රණය නොවී ඉවත්ව යෑම සිදු වේ.

RGB පිංතූරයක් ඔබේ මොනිටරයේ මොන තරම් දීප්තිමත්ව ලස්සනට පෙණුනත්, මුද්‍රණ යන්ත්‍රයෙන් දූර්වර්ණවී මුද්‍රණය වීමට හේතුව මෙයයි.

මෙම ගැටළුවට විසඳුමක් ඇතිද? යම් විශේෂිත ක්‍රියාමාර්ග මගින්, මෙය නිරාකරණය කළ හැකිය. මේ සඳහා පරිගණක ග්‍රැෆික් ක්ෂේත්‍රයේදී බහුලව භාවිතා කරනු ලබන මෘදුකාංගයක් වන Adobe Photoshop 7 උපයෝගී කරගත හැකිය.

"සත්‍ය වශයෙන්ම මෙම විසඳුම වනාහී, මොනිටරයේ වර්ණ අනුව මුද්‍රණ යන්ත්‍රය සුසර කර ගැනීම නොව, මුද්‍රණ යන්ත්‍රයේ(CMYK) වර්ණ පරාසය අනුව මොනිටරයේRGB වර්ණ CMYK වර්ණ පරාසයක් බවට පරිවර්තනය කිරීමයි." (2 රූපය)

ගැටළුව පියවර දෙකකින් විසඳීමට යෝජනා කරමි.

පියවර 1

මොනිටරයේ RGB වර්ණ CMYK පරාසය තුළ කොටුකර තැබීම

මේ සඳහා Photoshop 7 භාවිතා කරන්න.Photoshop 7 මගින් මුද්‍රණයට යැවීම සඳහා අලුත් නිර්මාණයක් කිරීමට යන ආරම්භක අවස්ථාවේදීම, එහි වර්ණ පරාසයRGB නොව CMYK ලෙස සකස් කිරීමට වගබලාගන්න. ඒ සඳහා File New භාවිතා කරන්න. (3 රූපය) 3 රූපයේ පරිදි CMYK ලබා ගන්න.

එයින් ලබා ගන්නා අලුත් පසුතලය මත ගල්වන සෑම වර්ණයක්මRGB වුවත්, ඒවා CMYK පරාසය තුළ (සීමාකළ) ලබාගන්නා RGB වර්ණ වේ. නමුත් මෙහිදී ඒවා CMYK වර්ණ ලෙසම පහසුවට අපි හඳුන්වමු.

පියවර 2

දැන් අප පැමිණ ඇත්තේ වැදගත්ම පියවරටය. එනම්, ප්‍රින්ටරයේCMYKවර්ණ මොනිටරයේ CMYKවර්ණ සමග සම කිරීමයි.




මේ සඳහා පළමුකොටම Photoshop මගින්, සුදු පසුබිමක CMYKමූලික හා ද්විතියික වර්ණ අඩංගු ආදර්ශ ග්‍රැෆික් රූපයක් නිර්මාණය කරගත යුතුය. මේ සඳහාPhotoshop දැනුම අත්‍යවශ්‍ය වේ. 3 රූපයේ පරිදි අලුත් පසුබිමක් සකසා ගන්න. (වර්ණ ක්‍රමය CMYK ලෙසද, පසුබිම සුදු ලෙසද,resolution, 150 ලෙස ද ප්‍රමාණය A 4 ලෙසද සකසා ගන්න.) මෙම සුදු පසුබිමේ, 4 රූපයේ පරිදි උඩ සිට පහළට කොටු 9 ක් (එක කොටුවක් 2" 1" ප්‍රමාණයට ගන්න.) නිර්මාණය කරගෙන ඒවාCMYK මූලික හා ද්විතියික වර්ණ වලින් පුරවාගන්න.

උදාහරණයක් ලෙස, මුල් කොටුව Cyan වලින් පුරවන්න. ඒ සඳහා Cyan 100% අනුපාතයට ගන්න. පිළිවෙළට පිරවිය යුතු වර්ණත් එහි අනුපාතයත් 4 රූපයේ පැහැදිලිව දක්වා ඇත. එහි My ලෙස දක්වෙන්නේ,Majenta 100% ත්, Yellow 100% ත් මිශ්‍රකොට 4 වැනි කොටුව පිරවිය යුතු බවයි. කොටු 9 ම රූපයේ පරිදි පුරවාගන්න. කැමති නම් කොටු යටින් එහි කෙටි නාමය දType කරන්න. අවශ්‍ය නම් මේ නිර්මාණයSave කර තබාගන්න. දැන් මෙම රූපය ඔබගේCMYK මුද්‍රණ යන්ත්‍රයෙන් Inkjet කඩදාසියක් මත මුද්‍රණය කරන්න.

ඔබගේ අතට මෙම කඩදාසිය ගෙන එය මොනිටරය අසලට රැගෙන යන්න. මොනිටරයේ විවෘත වී ඇති වර්ණ රටා 9 සමඟ කඩදාසියේ ඇති වර්ණ රටා 9 සමාන වේදැයි පරීක්ෂා කර බලන්න.

ඔබ සිතන්නේ කුමක් ද? ඔව් වර්ණ මඳක් වෙනස් ය. මොනිටරයේ වර්ණ, කඩදාසියේ වර්ණ වලට වඩා මඳක් දීප්තිමත් ය.









**ඔබගේ පරිගණක මුද්‍රණ යන්ත්‍රය වෙත, අවධානය යොමුකරන්න. එහි ඇත්තේ මූලික වර්ණ 4 ක් සහිත තීන්ත කාට්රිජ් 4 කි. එම මූලික වර්ණ නම්, නිල් පැහැය ජනිත කරන සයන් (Cyan) රතු පැහැය ජනිත කරන මැජේන්ටා (Magenta) කහ පැහැය ජනිත කරන කහ (Yellow) සහ කළු පැහැය ගෙන දෙන කළු (Black) වේ.**

මෙයට හේතුව මොනිටරයේ සහජ දීප්තිඋත්භාවය නිසා වර්ණත් දීප්තිමත්ව පෙනීමයි. මෙය අප නිවැරදි කරගත යුතු ය.

ඒ සඳහා කළ යුත්තේ කඩදසියේ වර්ණවල දීප්තිමත්භාවයට ගැළපෙන අයුරින් මොනිටරයේ CMYK වර්ණවල දීප්තිමත්භාවය සියුම් ලෙස සුසර කර ගැනීමයි. එනම් අප දැන් මෙම ලිපියේ වැදගත්ම කොටස වෙත එළඹ සිටී.

ඒ අනුදමට වර්ණ සුසර කරගන්නේ කෙසේද?Photoshop තුළින්ම එය කර ගත හැකිය.

1. Edit Colour Setting යටතේColor Setting පැනලය විවෘත කරන්න. (5 රූපය) එහිworking Space යටතේ ඇති CMYK වදන ඉදිරියේ සුදු කොටුව මත "Photoshop 5 default CMYK" යන්න දක්වා ඇත. එය දැනට විවෘතවී ඇතිCMYK වර්ණ රටාවේ Setting එකේ නමයි.

(2) සුදු කොටුව ඉදිරියේ පහළට යොමුවූ කුඩා ඊතලයClick කළ විට වෙනත් CMYK Setting කීපයක ලැයිස්තුවක් දිගහැරේ. එහි "Custom CMYK" වදන Click කළ විට "Custom CMYK" පැනලය විවෘත වේ. (රූපය 6)

(3) එහි Ink colours ඉදිරියේ ඇති සුදු කොටුව මත "Swop (Coated)" වදන දිස් වේ. වදනට දකුණින් ඇති පහළට යොමුවූ කුඩා ඊතලය Click කළවිටINK Colours අඩංගු ලැයිස්තුවක් දිගහැරේ. එහි"Custom" වදන Clickකළ විට"Ink Colours" නැමති පැනලය විවෘත වේ. (7 රූපය)

අපගේ කාර්යයට ඉතාමත් අවශ්‍ය පැනලය මෙයයි. මෙහිC,M,Y,K යනාදී වර්ණ රටා 9 ක් අඩංගු වේ. එහි වම් පස එහි නම් පෙළත්, දකුණු පස වර්ණ රටා අඩංගු කොටු 9 කුත් දක්වා ඇත. මේ කොටු වනාහී, මොනිටරයේ දිස්වන CMYK රටා වෙන් වෙන් වශයෙන් පැහැදිලි ලෙස දැක්වීමකි. (එය කලින් ඔබSave කරගත් ග්‍රැෆික් චිත්‍රයේ ඇති වර්ණ රටාවම වේ.) නමුත්, මෙහි විශේෂත්වය නම් මෙම කොටු එකින් එක Click කළ විට එහි වර්ණය සියුම් ලෙස වෙනස් කරගත හැකි පහසුකමක් තිබීමයි. මෙසේ, Ink Colours පැනලයේ වර්ණ වෙනස් කරන ආකාරය මෙසේ ය.

(1) මුද්‍රණ කඩදසිය මොනිටරය අසළට රැගෙන යන්න, පැනලයේ ඉහළින්ම ඇති වර්ණ කොටුව වන C කොටුව (Cyan) සමග මුද්‍රණ කඩදාසියේ ඉහළව ඇති C කොටුවේ වර්ණය සසඳ බලන්න. වර්ණ දෙකම එක සමාන (දීප්තිමත් භාවයෙන්) නම් ප්‍රශ්නයක් නැත. වර්ණ අසමාන නම්, පැනලයේ Cකොටුවclick කරන්න. එවිට "Colour Picker" නමැති පැනලය විවෘත වේ. (8 රූපය) 8 රූපයේ"a" වලින් දක්වා ඇති විශාල වර්ණ ප්‍රදේශයේ තැනින් තැන කර්සරය Click කර කඩදසියේ C වලට වඩාත්ම ගැළපෙන C වර්ණය තෝරාගන්න. තෝරාගත්C වර්ණය 8 රූපයේ "b" වලින් දක්වා ඇති තැන දර්ශනය වේ. ඔබ නිවැරදි C වර්ණයක් තෝරා ගත්තේ නම්, "b" වලින් දක්වා ඇති ස්ථානයේC වර්ණයත්, කඩදසියේ අඇති C වර්ණයත්, බැලූ බැල්මට එක සමාන විය යුතුය. දැන් එහි "OK" බොත්තම Click කරන්න. මේ ආකාරයට ඉතිරි වර්ණ 8 ත් සුසර කරගත යුතුය. වර්ණ සියල්,ම සුසර කරගත් පසු කඩදසියේ වර්ණ 9 ත්, Ink colours පැනලයේ වර්ණ 9 ත් බොහෝදුරට එක සමාන වේ. මෙය ඇස්මට්ටමින් ලබාගන්නා මිම්මක් නිසා මෙය 100% ක් නොව 90% ක් පමණ නිවැරදි ක්‍රමයකි.

සියු වර්ණ සුසර කරගත් පසු Ink coloursපැනලයේ"OK" බොත්තම Clickකර එම පැනලය නිවා දමන්න. එපිට "Custom CMYK" පැනලයේInk coloursඉදිරියේ "others" යන වදන දිස් වේ.

එහි Name යන ස්ථානයේ, ඔබට මතක තබාගත හැකි නමක් Type කරන්න. මෙය අලුත් CMYK Settingඑකේ නම බවට පත් වේ. උදහරණයක් ලෙස නම සඳහා"CMYK on inkjet Paper" වැනි නමක් යොදන්න. ඊළඟට මෙම පැනලයේ "OK" බොත්තම Click කරන්න. එවිට Colour Setting පැනලයේCMYK වදන ඉදිරියේ, අලුතින් නිපදවූ Setting එකේ නම දර්ශනය වේ.

Colour Setting පැනලයේ CMYK පමණක් නොව RGB Setting / Grey Scale setting ඈද Colour Setting කීපයක්ම ඇත. අප වෙනස් කළේCMYK Settingඑක පමණි. අනෙක්වා මෙතැනදී වැදගත් නොවේ. එසේම අලුතින් වෙනස් කළ setting එකක් සමග අනෙක්




Setting සියල්ලම එකමSetting එකක් ලෙස සලකා එය වෙනමSave කර ගත හැකිය. ඒ සඳහා මෙම පැනලයේ"Save"බොත්තම Click කරන්න. ඒ සඳහා "New Setting for Inkjet" වැනි කැමති නමක් යොදා Save කරගත හැකිය.

දැන් සියල්ල නිමවී ඇත. මින් ඉදිරියට ඔබ මොනිටරය පණගන්වන සෑම අවස්ථාවකම ස්වයංක්‍රීයව ඔබ අලුතින් සාදගත් CMYK Setting එක ක්‍රියාත්මක වේ.

එසේම මොනිටරය මත CMYK වර්ණ වලින් යම් නිර්මාණයක් කර එය මුද්‍රණය කළත් වර්ණයෙහි වෙනසක් හෝ වර්ණවල දීප්තිමත්භාවයේ වෙනස්ත ඇති නොවේ. මෙය ඔබේ අවසාන ඉලක්කයයි. ඔබ දැන් ජයග්‍රහණය කර ඇත.

ලිපිය අවසාන කිරීමට පෙර අත්‍යවශ්‍ය කරුණක් සිහිපත් කරමි. ඉහත ඉලක්කය සපුරාගත හැක්කේ, මුද්‍රණ යන්ත්‍රයටInkjetකඩදසි පමණක් භාවිතා කළොත් පමණි. එයට හේතුව මෙම වර්ණ සුසර කර ගැනීම අප කළේ එවැනි කඩදසි වර්ගයකින් නිසාය. වෙනත් කඩදසි වර්ග ද (එනම්, Photo paper, photocopy paper, Glossy paperආදී) භාවිතා කර මුද්‍රණයන් ලබාගෙන, මෙම පරීක්ෂණයම සිදුකර එම Settingඅදාළ නම් වලින් වෙන වෙනම Save කර තබා ගත යුතු බව සිහි කරමි.

මෙසේ කඩදසි වර්ග කිපයක්ම ලබාගෙන මෙම පරීක්ෂණය කිරීමට හේතුව විවිධ කඩදසි වර්ග වර්ණ උරාගැනීමේ ප්‍රතිශතය මත එකම පිංතූරය සුළු සුළු වශයෙන් වෙනස් වී මුද්‍රණය වීමයි. හැකි නම් ඔබගේ පිංතූරයoflset මුද්‍රණයකට යවා එහි ප්‍රතිඵලත්Setting එකක් ලෙස Save කර තබා ගන්න.

දැන් ඔබේ පරිගණකයේ, කඩදසි වර්ග අනුව Colour Settingකිපයක්ම තැන්පත්වී ඇත.

දැන් Photoshop විවෘත කළ පසු ඔබ කළ යුත්තේ මෙයයි. CMYK යටතේ පිංතූරයක් නිර්මාණය කිරීමට යාමේදී එය අවසානයේ මුද්‍රණය කරගත යුත්තේ කුමන කඩදසියකද යන වග කල් තියාම දැනගන්න.

උදාහරණයක් ලෙස පිංතූරය Photo Paper නමැති කඩදසියේ මුද්‍රණය කිරීමට යන්නේ නම්, එය අදාළ Colour Setting එක විවෘත කරගන්න. ඉන් පසුවයි ඔබ චිත්‍රය නිර්මාණය කරගත යුත්තේ. ඔබ Offset මුද්‍රණයකට ඔබේ පිංතූරය යවන්නේ නම් ඊට අදාළ Setting එක විවෘත කරගන්න. මෙහිදී වන්නේ, Offsettමුද්‍රණයෙන් නිකුත්වන අවසාන ප්‍රතිඵලයේ වර්ණ කල්තියාම නිවැරදිව ඔබේ මොනිටරයෙන් බලාගත හැකිවීමයි.

නිතරම එකම කඩදසි වර්ගයක් එල්ල කරගෙන ඔබ පරිගණකයේ වැඩෙහි යෙදෙන්නේ නම් විටින් විට Colour Setting මාරුකිරීම අවශ්‍ය නොවේ.

ලිපිය අවසන් කිරීමට මත්තෙන් තවත් එක් කරුණක් සිහිපත් කරමි. මෑතකදී ලංකාවට පැමිණි Digital Photo මුද්‍රණ ක්‍රමයේදී, භාවිතා වන්නේ RGB මුද්‍රණ ක්‍රමයකි. ඒ සඳහා භාවිතා වන්නේ RGB මුද්‍රණයි. ඒ සඳහා පිංතූරයක් නිර්මාණයේදී CMYK ක්‍රමයට පරිවර්තනය කිරීමට අවශ්‍ය නොවන බව මතකයේ තබා ගන්න. ❑

## ඉන්දු පකිස්තාන් ... 31 පිටුවෙන්

කාශ්මීරයේ ප්‍රන්ච් දිස්ත්‍රික්කයේ පහසුවෙන් විය නොහැකි කඳුකර ප්‍රදේශයෙහි මෙම මෙහෙයුම වැඩි වශයෙන් කේන්ද්‍ර ගත වී තිබුණි. ඉන්දියා යුද හමුදවට අවශ්‍ය සැපයුම් යවන ක්‍රමෝපායික මාර්ගය පිහිටි ප්‍රදේශයේ කැරලිකරුවන් තම කඳවුරු ශක්තිමත් කර තිබූ බව හමුදව කියි.

එම ප්‍රදේශයේ තිබූ කැරලිකරුවන්ගේ කඳවුරු රැසක් විනාශ කර අවි ආයුද තොග අත් අඩංගුවට ගත් බවද හමුදව පැවැසීය. කැරලිකරුවන් සතුව තිබූ චන්ද්‍රිකා හරහා පණිවුඩ යැවෙන දුරකතන ගණනාවක් සොයා ගත් බවත් එම දුරකතනවල පාකිස්තානයේ අංක සටහන් කර තිබුණ බවත් හමුදව වැඩිදුරටත් කිය.ඉන්දු පාකිස්තාන් සබඳතා වර්ධනය කර ගැනීමට දෙරටේ දේශපාලනඥයන් කටයුතු කිරීම මධ්‍යයේ කැරලිකාර කටයුතු අඩු වී යනු ඇතැයි විශ්වාසයක් පැවැති නමුත් එවැන්නක් සිදුවී ඇතැයි ඉන්දියා හමුදව කියයි.

කැරලිකරුවන් දිනපතාම අහිංසක සාමාන්‍ය වැසියන් මරා දමන බවත් ආරක්ෂක හමුදවලට පහර දෙන බවත් සඳහන් කරන හමුදව කැරලිකරුවන් මරා ගෙන මැරෙන ප්‍රහාර කිහිපයක්ම ක්‍රියාත්මක කළ බවත් පවසයි.

මේ අතර ඉන්දියාවේ දැඩි මතධාරී හින්දු සංවිධානවලින් දෙරට අතර විශ්වාසය කහවුරු කිරීමේ වැඩ පිළිවෙලට සහායක් නොලැබෙයි. පාකිස්තාන් මන්ත්‍රීවරුන් පිරිසක් ටජ් මහල් නැරඹීමේ සංචාරයක යෙදී සිටියදී බජ්රංදල් සිව සේනා වැනි අන්තවාදී සංවිධානවල සාමාජිකයෝ එම මන්ත්‍රීවරුනට විරෝධය පළ කළහ.

ඉන්දියාවත් පාකිස්තානයත් අතර විශ්වාසය තහවුරු කර ගෙන දෙරට අතර ඇති ප්‍රශ්න විසඳ ගැනීමේ මාර්ග සිතියමක් සැකසීමේ කාර්යය කෙතරම් උදාර කටයුත්තක් වුවත් එම සිතියම ඔස්සේ ගොස් අපේක්ෂිත තොටුපොළ වෙත ළඟාවීම අතිශය දුෂ්කර කාර්යයක් බව අවබෝධ කර ගැනීම අපහසු නොවනු ඇත. ❑

## රස කතා

### කැමතිම තැන

මහා විද්‍යාඥ තෝමස් අල්වා එඩිසන් මහන්සි වී වැඩ කළ මිනිසෙකි. නොනැවති සහ මහන්සි වී වැඩ කිරීමෙන් හෙතෙම මහත් වූ ප්‍රමෝදයක් ලැබුවේ ය. ඔහු රසායනාගාරයට ඇතුල් වූ කල්හි බොහෝ වේලාවක් එහි රැඳී සිටින්නේය. ඔහුගේ බිරිඳ මෙයින් චකිතයට පත්වී සිටියා ය.

දිනක් බිරිඳගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියේ ය. රසායනාගාරයට ඇතුල් වූ එඩිසන් පිටතට එන පාටක් නැත. ඔහු පිටතට පැමිණි කල්හි බිරිඳ කෝපාවිෂ්ට වී සිටියා ය.

"ඔබ පැය විසි හතරක්ම වැඩ කළා. ඉතින් ඔබ පොඩි විවේකයක් ගත්තොත් නරක ද?"

"ඒත් මං ඒකට කොහාටද යන්නේ ?" එඩිසන් ඇසුවේය.

"ඔබ කැමැති තැනකට යන්න." බිරිඳ උත්තර දුන්නා ය.

"හරි, මං එහෙනම් කැමැති තැනට යන්නම්." එඩිසන් මෙසේ පවසමින්, කෙළින්ම ගියේ තම රසායනාගාරය ඇතුළට ය!

### ඇතුල්වීම සහ පිටවීම

මහා විද්‍යාඥ අයිසැක් නිව්ටන් ඇඳ සිටි කෝට්එක වෙනට ඇඟිල්ලක් දිගු කළ එක්තරා මිනිසෙක් මෙසේ කීවේ ය.

"නිව්ටන් මහත්මයෝ, ඔබේ කෝට් එකේ ඔය සිදුරෙන් දුප්පත්කම එබිලා බලනවා."

සරදම් බස් බිණුමෙහි සමත් නිව්ටන් මෙසේ පැවසුවේ මිනිසා නිරුත්තර කරමිනි.

"නෑ මහත්මයෝ, ඒ සිදුරෙන් ඔබේ මෝඩකම ඇතුල්වෙනවා."

රචනය :- බී. මුකර්ජි

**අනුවාදය :-**
**පරාක්‍රම ඇස්. විජේවර්ධන**